# ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව
# අම්පාර දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 06 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඉරක්කාමම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජී/එස්එෆ්පීඑස්ජ්එස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂන විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු රු. 11,500 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) විදුලි ගාස්තු ජල ගාස්තු හා දුරකථන ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂයට ගෙවියයුතු එකතුව රු. 15,884 ක මුදල් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ පරිත්‍යාගයක් වශයෙන් ලද කැබ් රථයේ වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඒෂියා ෆවුන්ඩේෂන් වෙතින් පරිත්‍යාග වශයෙන් ලැබුණු පුස්තකාල පොත් 57 හි වටිනාකම තක්සේරුකර ගිණුම් වලට ගෙන නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන අයිතමයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 3,476,675 | ස්ථාවර වත්කම් ලේඛනය |
| උපකරණ හා සවිකිරීම් | 21,890 | |
| විදුලි උපකරණ | 57,600 | |
| හිඟ මස් කඩ බදු මුදල | 535,277 | විස්තරාත්මක උපලේඛන, ලේඛනය සහ හිඟ බදු ලේඛනය |

### 1.3.4 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 12(1) සහ (2) වගන්ති සහ පළාත් පාලන, නිවාස ඉදි කිරීම් සහ ඉදි කිරීම් කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවරි 13 වන දින අංක 488/16 දරණ ගැසට් පත්‍ර දැන්වීමේ උප වගන්ති 31(1) | ප්‍රාදේශිය සභාවේ කටයුතු ලිහිල් කිරීමේ අදහසින් අංගසම්පූර්ණ තීරණ ගැනීම සඳහා සහ උපදෙස් ලබා දීම සඳහා සභාවේ මුදල්, ප්‍රතිපත්ති සැලැසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධන, තාක්ෂන සේවා, පාරිසරික සහ පොදු පහසුකම් යන කරුණු සඳහා කාරක සභා පත්කල යුතුබව සඳහන්වුවද, 2014 මැයි 28 දින දක්වා ඒ අනුව කාරක සභා පත්කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571(2) | රු. 151,470 වටිනා කල් ඉකුත්වූ තැන්පත් මුදල සම්බන්ධයෙන් 2014 මැයි 28 දින දක්වා කටයුතුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 233,504 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත්

වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 1,452,683 ක් වූයෙන් මූලා‍ය ප්‍රතිඵලයෙහි රු. 1,219,180 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 වරිපනම් හා බදු

-------------------

පහත සඳහා නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134, 158 සහ 159 වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුල තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි වලින් 2003 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා වරිපනම් බදු ගණනය කර අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ය අයවැය ලේඛනයේ සමාලෝචිත වර්ෂ සඳහා රැස්කිරීමට ඇස්තමෙන්තුකළ වරිපනම් බදු රු. 165,000 ක මුදලින් 1.78% ක වන රු. 2,938 ක මුදලක් අයකර තිබුනි.

2.2.2 බලපත්‍ර ගාස්තු

----------------

සමාලෝචිත වර්ෂයේ අය වැය ලේඛනය අනුව කඩ සහ ආයතන පවත්වා ගෙන යෑම වෙනුවෙන් අයකර ගැනීමට ඇස්තමෙන්තුකර ඇති බලපත්‍ර ගාස්තු රු. 1,140,000 ක මුදලින් 41.8% ක් වන රු. 477,360 ක මුදලක් අයකර තිබුණි.

2.2.3 වෙනත් ආදායම්

------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාව විසින් අයකිරීමට අදාල අතුරු ව්‍යවස්ථා පනවා නොතිබූ හේතුවෙන් සභා බල ප්‍රාදේශයේ පෞද්ගලික ආයතනයන් ඔවුන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිත කරන ලද ප්‍රචාරක පුවරු 09 කින් බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් ගාස්තු අයකිරීමට නොහැකිවී තිබුණි. ඒ අනුව රු. 40,680 ක ආදායමක් අහිමිවී තිබුණි.

(ආ) 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වාවූ හිඟ මස්කඩ බදු කුලී රු. 1,032,323 ක මුදල අයකර ගැනීම සඳහා 2014 මැයි 28 දින දක්වා කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

2011 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා කොන්ත්‍රාත් කරුවන්ගෙන් අයකර ගත් එකතුකල අගය මත බදු රු. 739,505 ක මුදල දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වෙතට ප්‍රේෂණය කිරීම සඳහා විගණන දිනය වන 2014 මැයි 28 දක්වා කටයුතු කර නොතිබුණි.

3.2 නිශ්ක්‍රිය වත්කම්

-------------------

ප්‍රාදේශීය සභාවේ මායිම් හඳුන්වා දීම සඳහා 2012 වර්ෂයේ රු. 60,000 මුදලක් වැයකර නාම පුවරු 04 ක් සකස්කර තිබු නමුත් නාම පුවරු 02 ක් 2014 මැයි 27 දිනය දක්වා අදාල ස්ථාන වල සවි කිරීමකින් තොරව සභා ගබඩාවේ තිබූ බව නිරීක්ෂණය විය.

3.3 ආර්ථිකමය නොවූ ගණුදෙනු

--------------------------------

ඉරක්කාමම් විවෘත පොළ ගොඩනගිල්ලේ මාසික ජල බිල මාසිකව ගෙවීමට අපොහසත් වීම නිසා ජාතිය ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත දඩ මුදල් වශයෙන් රු. 1,743 ක මුදලක් සමාලෝචිත වර්ෂයෙදී ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තියෙන් විධිවිධාන සලසා තිබුණ ද සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය